# 06 නෙළුම්දෙණියෙන් පිපුණු නෙළුම්

සියලු ප්‍රවෘත්ති හා සිද්ධි මුල්කරගත් දැනුම් සම්භාරයෙන් වැඩි ම කොටසක් අප විසින් ග්‍රහණය කරගනු ලබන්නේ සවන් දීමෙනි. විවිධ විෂයයන් ඉගෙනීම, නිවසේ කටයුතු, පරිසර විෂමතා ආදි කරුණු මැද වුව ද ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයෙන් අපට තොරතුරු ගලාගෙන එයි. එසේ ලැබෙන තොරතුරුවල සාරය ග්‍රහණය කර ගැනීමෙන් අපේ සන්නිවේදන හැකියා ප්‍රගුණ කර ගත හැකි ය. එසේ තම හැකියා ප්‍රගුණ කර ගත් සිසුන් දෙදෙනෙකු විසින් පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී සිදු කරනු ලැබූ විස්තර ප්‍රකාශය මේ පාඩමෙන් ඔබට වාර්තා වෙයි.

එසේ ම විස්තර ප්‍රචාරණයේ දී හා උත්සව පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු ක්‍රමවිධි හා ඒවායේ අනුපිළිවෙළ ගැන ද අවබෝධයක් මෙයින් ඔබට ලබා ගත හැකි වෙයි.

නෙළුම්දෙණිය මහ විදුහලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය මෙවර අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට කටයුතු සංවිධාන කෙරිණ. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා, දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා, ප්‍රාදේශීය ලේකම්වරයා ඇතුළු ආරාධිත අමුත්තෝ රැසක් උලෙළට සහභාගි වූහ. තම දරුවන්ගේ කුසලතා උදෙසා ත්‍යාග හා සහතික පත් ලබන අයුරු නැරඹීමට සිසු දරු දැරියන්ගේ දෙමාපියෝ ද, ආරාධිත අමුත්තෝ ද විශාල සංඛ්‍යාවක් රැස්වීම් ශාලාවේ අසුන් ගෙන සිටියහ.



විදුහලේ ගුවන්විදුලි ළමා සමාජය මගින් විස්තර ප්‍රචාරණ හැකියාව වර්ධනය කර ගත් ප්‍රියවදනී වර්ණසේකර ශිෂ්‍යාවත්, ධනංජය ජයවර්ධන ශිෂ්‍යයාත් උත්සවයේ විස්තර ප්‍රචාරක කටයුතු සිදු කළහ.

**ප්‍රියවදනී :** ආයුබෝවන්! සියලු දෙනාට ම සුබ සන්ධ්‍යාවක් වේවා! යි පළමුවෙන් ම ප්‍රාර්ථනා කරනවා. අප විදුහලට වසරේ වැදගත් ම සහ වාසනාවන්ත ම දවස වන අද දින මේ සුන්දර වූ සන්ධ්‍යාවේ ශිෂ්‍ය දක්ෂතාවන්ට අගයක් එක් කරමින් තමන්ගේ අතින් අනිත් අයට තෑගි බෙදන්නට, තමන්ගේ නෙතින් අනිත් අය තෑගි ලබනවා දකින්නට මේ භාග්‍යවන්ත හෝරාවට එක්වීමට වැඩමවා සිටින අතිගෞරවනීය සංඝරත්නයෙන් අවසරයි. දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගෙන්, ප්‍රාදේශීය ලේකම්තුමාගෙන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගෙන්, ආදරණීය දෙමාපියන්ගෙන් සහ ප්‍රිය සහෝදර සහෝදරියන් යන ඔබ සැමගෙන් අවසරයි. අප දැන් සූදනම් වන්නේ පුරා වසරක් විවිධ ඉසව් ඔස්සේ සිය සහජ හැකියාවන් විදහා දැක්වූ අතිදක්ෂ වූ අපේ ම සොයුරු සොයුරියන්ගේ එම දක්ෂතා අගයමින් ඔවුනට තිළිණ සහ සහතික පත් ප්‍රදානය කිරීමේ උත්සවය ආරම්භ කරන්නයි.

**ධනංජය :** නෙළුම් මෙන් විකසිත ව, නෙළුම් මෙන් පවිත්‍ර ව, නෙළුම් මෙන් මතු ව නෙළුම්දෙණිය විදුහලේ දරුවන් පිදුම් ලබන්නා වූ මේ අගනා අවස්ථාවේ අපි අපගේ හෙළ චාරිත්‍රයට ගරු කරමු. පළමු ව චාරිත්‍රානුකූල ව පොල්තෙල් පහන දල්වමු. ඒ උතුම් කාර්යය සඳහා සහභාගි වන ලෙස මා ගෞරවයෙන් යුතු ව ආරාධනා කරනවා, ගරු මන්ත්‍රීතුමාට, ගරු ප්‍රාදේශීය ලේකම්තුමාට, ගරු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට, අප විදුහලේ ගරු විදුහල්පතිතුමාට, එක් ආදරණීය මවකට, එක් ආදරණීය පියතුමෙකුට සහ ත්‍යාගලාභී වින්ධ්‍යා ජයසේකර සොයුරියට. මංගල භේරි වාදනය මැද ඔබතුමන්ලාගේ වාසනාවන්ත සුරතින් දල්වන්න පහන්සිළු.

(මංගල භේරි නාදය මැද පහන් දැල්වීම)

**ප්‍රියවදනී :** නෙළුම්දෙණිය මහ විදුහල නැමැති පහනින් අපගේ ජීවිත ආලෝකවත් වන ආකාරය විදහා පාන්නක් මෙන් පහන්සිළු එකිනෙක දැල් වී ප්‍රභාලෝකවත් වන අන්දම කෙතරම් චමත්කාරජනක ද? ඉතින් ඒ ආලෝකය මැද පහන් දැල්වීමට දයක වූ ඔබ හැම දෙනාට ම අපගේ ගෞරවය සහ ස්තුතිය පුදකර සිටිනවා.

පාසලක ජීවය වන්නේ විනය යි. ආගමික හැඩගැස්ම හා හැදියාව විනයගරුක දරු පරපුරක් බිහි කිරීමේ පදනම යි. මේ අවස්ථාවෙත් අපි ඊට හිස නමමු. මා පාද නමස්කාර පූර්වක ව ආරාධනය කර සිටිනවා, අප ගරුතර ස්වාමීන් වහන්සේට පිරිස පංචශීලයේ පිහිටුවන ලෙසට,

(පන්සිල් සමාදන් වීම)

**ධනංජය :** යහපත් සමාජය සහ ආගමික හැදියාව ගසට පොත්ත සේ, පොත්තට ගස සේ එකට බැඳී පවතින්නක්. ආගමික වතාවත් ඉෂ්ට කළ ගරුතර ස්වාමීන් වහන්සේට අපගේ ගෞරවනීය ප්‍රණාමය හිමිවේවා!

නෙළුම්දෙණිය විදුහල මහා සාගරය තරණය කරන නෞකාවක් නම් එය නිසි මගට යොමු කරන නැව්පතිවරයා එතුමායි. මේ සියලු සත් කාර්යයන්ගේ ජීවය එතුමා ය. හැමදා අපගේ නැණ පහන් දල්වීමට ප්‍රදීපයක් වූ අප විදුහලේ ගරු විදුහල්පතිතුමාට මේ උත්කර්ෂවත් උත්සවයට සපැමිණි සැමදෙනා පිළිගනිමින් පිළිගැනීමේ කතාව පවත්වන ලෙස ගෞරවයෙන් කරන ආරාධනාවයි මේ.

(විදුහල්පතිතුමාගේ පිළිගැනීමේ කතාව)

**ප්‍රියවදනී :** ශාස්ත්‍රයේ, කලාවේ අධිපතිනිය සරස්වතී දේවී. අපි නමදිමු ඒ උත්තමාවී සරස්වතී දේවී. දැන් ඔබ දෙසවන් පුරා අසන්න සරස්වතී අභිනන්දන ගීතය. දෙනුවන් පුරා නරඹන්න සරස්වතී අභිනන්දන රංගනය.

(සරස්වතී අභිනන්දන ගීතය හා රංගනය)

**ධනංජය :** අප විදුහලේ අපේ ම ආදරණීය සොයුරු සොයුරියන් කිහිප දෙනෙකුට ත්‍යාග සහ සහතික පත් ප්‍රදානය කිරීමේ වාසනාවන්ත අවස්ථාවයි දැන් එළඹ තිබෙන්නේ. තිළිණ සහ සහතික පත් පිරිනමන්නට වේදිකාවට සැපත් වන ලෙස මා ගෞරවයෙන් ආරාධනා කරනවා අපගේ ගරු මන්ත්‍රීතුමාට. එතුමාගේ දැතින් මුලින් ම ත්‍යාග හා සහතිකය ලබන්නට වාසනාව හිමි වන්නේ මේ වසරේ පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් දිස්ත්‍රික් කුසලතා පළමු ස්ථානය ලබා ගනිමින් අප විදුහලට ඉමහත් ගෞරවයක් ගෙන දුන් අවිනි නදීෂා කුඩා නැඟණියන්ටයි. ඇයට අප ආදරයෙන් ආරාධනය කරනවා වේදිකාවට පැමිණ තමන්ට හිමි සහතිකය සහ තිළිණය ලබා ගන්නා ලෙසට.

(සහතික හා ත්‍යාග ප්‍රදානය)

**ප්‍රියවදනී :** ඔවුහු අප පාසලටත්, ප්‍රදේශයටත්, ජාතියටත් මාහැඟි සම්පත් ය. දහසක් දුෂ්කරතා මැද බාධක කම්කටොලු මැඩ ඔවුන් ජය ගෙන ඇත. ඒ නිසා ම මීළඟ උපහාරය ලබන්නේ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සියලු ම විෂයයන්ට 'ඒ' සාමර්ථ්‍යයන් ලබා ගත් මධුභාෂිණී දිසානායක. ඔබටයි මේ ඇරයුම වේදිකාවට පැමිණෙන්නට.

(සහතික හා ත්‍යාග ප්‍රදානය)

**ධනංජය :** ඉගෙනුමට පමණක් අධ්‍යාපනයේ නිම්වළලු සීමා කර නො ගත් අප විදුහලේ දරුවන් නැටුමෙන්, ගැයුමෙන්, වැයුමෙන් දක්වන දස්කම් මනරම්. ඒ බව ඔබට සනාථ කරමින් මී ළඟ අංගය ලෙස ඉදිරිපත් කරන්නේ තුරඟා වන්නම.

ඔබේ දෑසින් නරඹන්න ඔබේ ම දරුවන්ගේ දස්කම්. ඔබේ සවනින් විඳින්න ගායන මිහිර.

(වන්නම් ගායනය)

**ප්‍රියවදනී :** ප්‍රදේශයේ ජනතාවගේ නියෝජිතයා ඔබයි. ප්‍රදේශයේ පුනරුදයේ පුරෝගාමියා ඔබයි. ඒ නිසා ඔබේ ප්‍රදේශයේ දරුවන් දක්වන දස්කම් දැක ඔබ තරම් සතුටු වන තවත් කෙනෙක් නැතිවා විය හැකි ය. මෙම විදුහලට තවදුරටත් ඉටු කළ යුතු දේ මොනවා දැයි දැන් ඔබට හිතෙනවා ඇති. එසේ නම් ප්‍රදේශයේ ජනතාව විසින් තෝරාගත් ප්‍රදේශයේ නියෝජිතවරයාණන් වන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමනි, අපි දැන් ඔබට ගෞරවයෙන් ආරාධනය කර සිටිනවා ඔබගේ අදහස් දැක්වීමට.

(මන්ත්‍රීතුමාගේ කතාව)

**ධනංජය :** කැලයේ පිපි මල් කැලයේ ම පර නොවී මුළු ලොවට ම සුවඳ දේවා! අද මේ කුඩා වේදිකාව මත තම සහජ හැකියාවන් වෙනුවෙන් ලබන මේ තිළිණය, සහතිකය ඒ සඳහා ඔවුන්ට දිරියක් ම වේවා!

අප නැවතත් එළඹෙමු තිළිණ ප්‍රදානයට. ඒ සඳහා වේදිකාවට සැපත් වන ලෙස ගෞරවනීය ආරාධනය ගරු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමන්ට.

**ප්‍රියවදනී :** නෙළුම්දෙණියේ ගම්මානය අවට සිසාරා බලන්න. පෙනෙන තෙක් මානයේ ගමේ දෑතේ සවියෙන් නිල් පැහැ ගැන්වුණු කෙත් යාය. සරු ගොවි බිම්, මෙවැනි බිමක හැදුණු, වැඩුණු, ක්‍රියාශීලී දරුවන් සමත් නො වන්නේ කුමකට ද? මෙම වසරේ සමස්ත ලංකා දැල්පන්දු අනුශූරතාව දිනාගෙන විදුහලේ කීර්ති නාමය දේශය පුරා විහිදවූ අප විදුහලේ දැල්පන්දු කණ්ඩායමටයි මේ ආරාධනාව. කණ්ඩායමේ සියලු දෙනා ම එක් පෙළක් ලෙසට පැමිණ ලබා ගන්න ඔබේ තිළිණ සහ සහතිකපත්.

(අත්පොළසන් හඬ මැද තිළිණ හා සහතික ප්‍රදනය)

**ධනංජය :** පාසලේ සාහිත්‍ය සංගමයේ දී, විවිධප්‍රසංගයේ දී ඇගේ මිහිරි හඬ අපේ සිත් සතුටු කරනවා. ඒ හඬ ඇය සමස්ත ලංකා මට්ටමකට රැගෙන ගියා. එහි දී නින්නාද නැංවූ ඒ මිහිරි රාවය ඇයට ජයග්‍රහණය හිමි කළා. එය ඇගේ පමණක් නොව, අප හැමගේ ජයග්‍රහණයක්. සිංහල භාෂා හා සාහිත්‍ය තරගාවලියේ සමස්ත ලංකා පද්‍ය ගායනා තරගය ජයග්‍රහණය කළ නදීෂා අබේවික්‍රම සොයුරියට තම තිළිණය හා සහතිකය ලබන්නට වේදිකාවට පැමිණෙන ලෙස ආරාධනය කරනවා,

තිළිණ ප්‍රදනය කිරීම පිළිබඳ ව ස්තුතිවන්ත වෙමින් ම මා දැන් ගෞරවයෙන් ආරාධනා කරනවා ගරු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමන්ට සභාව අමතන ලෙසට.

(කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ කතාව)


**ප්‍රියවදනී** : ලැබූ ජයග්‍රහණ උදෙසා උපහාර ලබා කොටසක් සතුටු වෙනවා පමණක් නො වෙයි. ඒ ජයග්‍රහණවලින් දිරිමත් වී ලබන වසරේ දී තවත් ජයග්‍රහණ ලබා, පිබිදෙන්නට සූදනම් වන මල් කැකුළු ද මේ තිළිණ ප්‍රදානෝත්සවයේ දී දිරිමත් වෙනවාට සැකයක් නෑ. එයයි මෙවන් උපහාර උලෙළකින් අපගේ ප්‍රාර්ථනය. එළඹෙන වසරේ දී මීටත් වඩා උසස් උත්සවයකින් ඔවුනට උපහාර පුදන්නට අපි හැම එකතු වෙමු. එම ප්‍රාර්ථනාවෙන් යුතු ව මීළඟ අවස්ථාව උද කර දෙන්නේ, අප විදුහලේ දෙවැනි ජීවමය ශක්තිය වූ උපවිදුහල්පතිතුමන්ට උත්සවය මෙතරම් උත්කර්ෂවත් කරන්නට උර දුන් ඔබ සැම උදෙසා ස්තුති කථාව පවත්වන්නට.

(ස්තුති කතාව)

**ධනංජය** : ගොම්මන් අඳුර මකාගෙන පුරා හඳත් ඇතින් නැගෙනවා. හරියට අපේ හිත් පුරා පිරුණු සතුට වාගේ. එයින් පිරුණු සතුටින් යුතු ව දූන් ඉතින් අපි මේ මහගු උත්සවයේ කටයුතු නිමා කරනවා.

අපට ජීවය දෙන අපේ දේශයේ අභිමානය විදහා දක්වන ජාතික ගීතය ගායනය කරමින් ඔබ සියලු දෙනාට ම වාසනාවන්ත අනාගතයක් ප්‍රාර්ථනා කරනවා, නෙළුම්දෙණිය මහ විදුහල වෙනුවෙන්.

## ක්‍රියාකාරකම 01



- පන්තිය කණ්ඩායම් දෙකකට බෙදෙන්න. එක් කණ්ඩායමක් ප්‍රියවදනීගේ විස්තර ප්‍රකාශය පන්තියට ඉදිරිපත් කරන්න. අනෙක් කණ්ඩායම ධනංජයගේ විස්තර ප්‍රකාශය ඉදිරිපත් කරන්න.

- උත්සව සභාවේ වැඩසටහන පාදකකොට ගෙන න්‍යාය පත්‍රයක් සකස් කරන්න.

ගුරුතුමා විසින් හෝ ගුරුතුමිය විසින් ඉදිරිපත් කරනු ලබන පහත දක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ධනංජය නෙළුම් උපමාවෙන් කියා පෑ අදහස් සියල්ල පිළිවෙළින් ලියන්න.

(ii) පොල්තෙල් පහන දල්වීමේ තෙවන හා සිවු වන අවස්ථා හිමි වන්නේ කාහට ද?

(iii) පහන් සිළු එකිනෙක දල්වී ආලෝකවත් වීමට අදළ උපමාව මතකයෙන් ලියන්න.

(iv) ගරුතර ස්වාමීන් වහන්සේට පන්සිල් දීම සඳහා සිදු කළ ඇරයුමේ පෙරවදන් ප්‍රකාශය ලියන්න.

(v) සමාජය හා ආගමික හැදියාව ධනංජය දුටුවේ කුමක් සේ ද?

(vi) පහත සඳහන් ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා ලියන්න.

උත්සව සභාවට පැමිණියවුන් පිළිගනු ලැබුවේ කවුරුන් විසින් ද?


(i) ශිෂ්‍යනායකයන්
(ii) ප්‍රියවදනී
(iii) ධනංජය
(iv) විදුහල්පතිතුමා

(vii) මන්ත්‍රීතුමා අතින් ත්‍යාග හා සහතික පත් පිරිනැමීමට තෝරා ගෙන තිබුණේ කවර නම් දක්ෂතා ද? අංකනය කරමින් ඒ දක්ෂතා ලියා දක්වන්න.

(viii) නෙළුම්දෙණිය විදුහලේ සිසුන්, නැටීම, ගැයීම, වැයීම යන කරුණු තුනට ම එක සේ දක්ෂ බව ආරාධිතයන් දැන ගන්නේ කුමකින් ද?

(ix) මන්ත්‍රීතුමාගේ කථාවෙන් පැහැදිලි කර ගැනීමට අවශ්‍ය කරුණු විස්තර ප්‍රකාශය මගින් සන්නිවේදනය කර ඇත්තේ කෙසේ ද?

## ක්‍රියාකාරකම 02



### ආරාධනා පත්‍ර ලිවීම

නෙළුම්දෙණිය මහ විදුහලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා පැමිණෙන ලෙස ඉල්ලමින් ආරාධිත පිරිස වෙත යැවුණු ආරාධනා පත්‍රය පහත දැක්වේ.

**සාදර ඇරයුමයි**

•

නෙළුම්දෙණිය මහ විදුහලේ

**වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය**

මෙවරත් අතිඋත්කර්ෂවත් අයුරින්

**2010 ඔක්තෝබර් මස 15වන දින**

**ප.ව. 2.00ට**

දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ

ප්‍රධානත්වයෙන් සහ

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා

ප්‍රාදේශීය ලේකම්තුමා

යන ප්‍රභූන්ගේ සහභාගිත්වයෙන්

**විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී**

**පැවැත්වේ.**

විදුහලේ දියුණුව හා ශුභසිද්ධිය පතන

ඔබවහන්සේගේ/ඔබතුමාගේ/ඔබතුමියගේ

පැමිණීම

සාදරයෙන් අපේක්ෂා කරමු.

**2010.10.02 දින**
**සමගිපුර**
**නෙළුම්දෙණිය මහ විදුහලේ දී ය.**

**විදුහල්පති, ගුරු මණ්ඩලය**
**ඇතුළු ශිෂ්‍ය ශිෂ්‍යාවෝ**

ඉහත දැක්වෙන ආරාධනා පත්‍රය පාදක කර ගෙන ආරාධනා පත්‍රයක ආකෘතිය හා අන්තර්ගතය පිළිබඳ විමසා බලන්න.

ඉහත ඉදිරිපත් කර ඇත්තේ නෙළුම්දෙණිය මහ විදුහල විසින් ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා පැමිණෙන ලෙස ඉල්ලමින් ආරාධිත පිරිස වෙත යවන ලද ආරාධනා පත්‍රය යි. ආරාධනා පත්‍රයක් විවිධ ක්‍රමවලට පිළියෙල කළ හැකි ය. කවර ක්‍රමයක් අනුගමනය කළ ද එහි පහත සඳහන් කරුණු ඇතුළත් කිරීම අත්‍යවශ්‍ය වේ.

- මාතෘකා පාඨය
- ආරාධනය කුමක් සඳහා ද
- ආරාධනයට අදාළ උත්සවය පැවැත්වෙන ස්ථානය
- උත්සවය සඳහා සහභාගි වන ප්‍රභූවරුන් කවුරු ද යන වග
- උත්සවය පැවැත්වෙන දිනය හා වේලාව
- ආරාධනය කරනු ලබන්නේ කවුරුන් විසින් ද
- ආරාධනය කෙරෙන දිනය හා ස්ථානය

ආරාධනා පත්‍ර සැකසීමේ දී ඒ සඳහා ම සුවිශේෂ වූ රීති දක්නට නො ලැබේ. එහෙත් ඒවා සැකසීමේ දී,

1. **සංක්ෂිප්ත බව**
2. **නිවැරදි සරල බස් වහර**
3. **අනවශ්‍ය විස්තරවලින් වැලකීම**

වැනි කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

ආරාධනා පත්‍ර අවශ්‍ය වන උත්සව අවස්ථා කිහිපයක් මෙසේ ය.

- විද්‍යාලයීය ක්‍රීඩා උත්සව
- විවෘත කිරීමේ උත්සව
- තනතුරු ප්‍රදානය කිරීමේ උත්සව
- විවාහ මංගල උත්සව

මේ එබඳු ගණයේ එක් ආරාධනා පත්‍රයකි.

> **කාරුණික ආරාධනයයි**
>
> රන්දෙණිය ග්‍රාම සංවර්ධන සමිතිය මගින්
> ගොඩනංවන ලද
> **'පිපෙන කුමුදු'** ළමා පුස්තකාලය
> 2010 අගෝස්තු 10වන ද පෙ.ව. 10.00ට
> යෙදෙන ශුභ හෝරාවෙන්
> ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ
> **ඒ.කේ. ගුණරත්න මහතාගේ**
> මූලිකත්වයෙන් විවෘත කෙරේ.
> මේ උත්සවයට සහභාගි වන ලෙස ඔබට
> ගෞරවයෙන් ආරාධනා කරමු.
>
> 2010 අගෝස්තු 01 දින
> රන්දෙණිය
> ග්‍රාම සංවර්ධන සමිතියේ දී
>
> ලේකම්
> ග්‍රාම සංවර්ධන සමිතිය

## ක්‍රියාකාරකම 03

(i) දීපිකා සමන්මලී 9 වන ශ්‍රේණියේ ඉගෙන ගනියි. 9 වන ශ්‍රේණියේ සමාන්තර ශ්‍රේණි 07ක් ඇති අතර එම ශ්‍රේණිවලට අදාළ **'සිරි රහල්'** සාහිත්‍ය සංගමයේ ප්‍රධාන ලේකම්වරිය ද දීපිකා ය. සාහිත්‍ය සංගම් සභා වාරයක දී එම සංගමය මගින් '**ලෝකයට යහපත උදා කළ හැක්කේ ආගම් මගිනි**', '**ලෝකයට යහපත උදා කළ හැක්කේ නවීන විද්‍යාව මගිනි**' යන මාතෘකා යටතේ විවාද තරගයක් පැවැත්වීමට තීරණය කෙරිණි.


එම තරගය නැරඹීමට දෙමාපියන්ට ආරාධනා කිරීමට ද එහි දී අනුමැතිය ලැබිණි. ඒ අනුව සංගමයේ ලේකම් දීපිකා සමන්මලී ඔබ යයි සිතා ඉහත දී ඇති උපදෙස් අනුව අදාළ ආරාධනා පත්‍රය පිළියෙල කරන්න.

(ii) 9 වන ශ්‍රේණියේ පන්ති ප්‍රදර්ශනය නැරඹීමට පැමිණෙන ලෙස ඉල්ලා ඔබ විදුහලේ විදුහල්පතිතුමා ඇතුළු ගුරු මණ්ඩලය වෙත යැවීමට ආරාධනා පත්‍රයක් සකස් කරන්න. පසුව,

- එය පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- එහි ආකෘතිය,
- අන්තර්ගත කරුණු

යන ශීර්ෂවල යෝග්‍ය/අයෝග්‍ය බව පන්තියේ සිසුන් සමග සාකච්ඡා කරන්න.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 04 

**කරුණු ග්‍රහණය කර ඉදිරිපත් කිරීම**

එදිනෙදා ජීවිතයේ දී විවිධ ප්‍රවෘත්ති හා විස්තර ප්‍රකාශ අපේ සවනට යොමු වේ. ඒවායේ අන්තර්ගත වැදගත් කරුණු අපගේ සන්නිවේදන හැකියා ප්‍රගුණ කර ගැනීමට ඉවහල් වේ. නිදසුනක් ලෙස මාධ්‍ය මගින් පැයෙන් පැයට විකාශය කෙරෙන ප්‍රවෘත්ති අපට තොරතුරු සම්භාරයක් ගෙනෙයි. එසේ ම විවිධ තේමා යටතේ සිදු කෙරෙන විස්තර ප්‍රකාශවලට සවන් දීමෙන් ද දැනුම් කෝෂය පුළුල් කර ගැනීමට නම් ඒවායේ ඇතුළත් වැදගත් කරුණු සාරාංශ කරගෙන ප්‍රකාශනයෙන් හෝ ලේඛනයෙන් ඉදිරිපත් කළ යුතු වේ. ඉහත දක්වූ නිපුණතාව සංවර්ධනය කර ගැනීම උදෙසා පන්තිය කණ්ඩායම් වශයෙන් සංවිධානය වී පහත දැක්වෙන අභ්‍යාසයේ යෙදෙන්න.

I. මේ එක් එක් කොටසට සවන් දී එහි වැදගත් කරුණු කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කරන්න.

(i) නූතන විද්‍යාවෝ බොහෝ වෙති. ආගම් හා දර්ශන වාද ද අනල්ප ය. මේ සියල්ලෙහි අවසාන ප්‍රතිඵලය වශයෙන් බොහෝ දෙනකු ප්‍රාර්ථනා කරන්නේ වඩාත් තෘප්තිමත් හා දීප්තිමත් ජීවිතයක් ගත කිරීමට යි. ආගමෙන් හෝ වේවා, විද්‍යාවෙන් හෝ වේවා, දර්ශන වාදයකින් හෝ වේවා තම ඉලක්කය සපුරා ගත හැකි මාර්ගයක් සෙවීම සාමාන්‍ය ස්වභාවයකි.

(ii) මිනිස් සම්බන්ධතාවන්හි අතීතය මිනිසා තරම් ම පැරණි වේ. සන්නිවේදන කුසලතා නො දියුණු ව පැවති ගල් යුගයේ දී පටන් ම කුමන හෝ ආකාරයකින් තම අදහස් හැඟීම් ප්‍රකාශ කරමින් මිනිස්සු කණ්ඩායම් ලෙස ක්‍රියාත්මක වූහ. මිනිසා සමාජ සත්ත්වයෙකු වීම නිසා ම ඔහුට මානව සම්බන්ධතාවන්හි වැදගත්කම තදින් දැනෙන බව පැහැදිලි ය.

(iii) ශ්‍රී ලංකාව විදේශීය සංචාරකයන් අතර වඩාත් ප්‍රසිද්ධ ව ඇත්තේ භෞමික හා දේශගුණික විවිධත්වයෙන් යුතු කලාප කිහිපයකට එක ම දිනයක පැය කිහිපයක් ඇතුළත දී ළඟා විය හැකි රටක් වශයෙනි. පෙරවරුව මුහුදුබඩ පෙදෙසක සිට රාත්‍රි ආහාරය සඳහා සීත දේශගුණයක් සහිත නුවරඑළියට හෝ බණ්ඩාරවෙලට හෝ ළඟා විය හැකි ය.

(iv) හෙළ වාරි කර්මාන්තයේ විශිෂ්ට නිර්මාණයක් ලෙස වැවක ප්‍රධාන අංගයක් වශයෙන් එක්කර ඇති බිසෝකොටුව නම් කළ හැකි ය. බ්‍රිතාන්‍ය ජාතික ඉංජිනේරුවකු වූ **හෙන්රි පාකර්** විද්වතා ලෝකයේ කිසි ම රටක විද්‍යමාන නොවන විස්මයජනක නිර්මාණයක් ලෙස බිසෝකොටුව හඳුන්වා දී ඇත.

## ක්‍රියාකාරකම 05

**පහත දැක්වෙන ආකාරයේ වගුවක් ඔබේ අභ්‍යාස පොතේ සකස් කරන්න.**

1. ගුවන්විදුලි මාධ්‍යයෙන් හෝ රූපවාහිනී මාධ්‍යයෙන් හෝ සති අන්තයේ එක් දිනයක ප්‍රචාරය වූ ප්‍රවෘත්තිවලට සවන් දී ඒවායේ ඇතුළත් වූ වැදගත් කරුණු පහත සඳහන් වගුවේ ඇතුළත් කර පන්තියට ඉදිරිපත් කරන්න.

| දිනය | වේලාව | ආර්ථික පුවෘත්ති | දේශපාලන පුවෘත්ති | සමාජ පුවෘත්ති | ක්‍රීඩා පුවෘත්ති | සංස්කෘතික පුවෘත්ති | වෙනත් |
|---|---|---|---|---|---|---|---|
| ............... | 1. පෙ.ව/ප.ව. .................ට | | | | | | |
| ............... | 2. පෙ.ව/ප.ව. .................ට | | | | | | |
| ............... | 3. පෙ.ව/ප.ව. .................ට | | | | | | |
| ............... | 4. පෙ.ව/ප.ව. .................ට | | | | | | |
| ............... | 5. පෙ.ව/ප.ව. .................ට | | | | | | |

2. ඔබ මෑත දිනයක සවන් දුන් විස්තර ප්‍රකාශයක් සිහිපත් කර ඒ මුල් කොට මේ පත්‍රිකාව සම්පූර්ණ කරන්න.
   (i) සජීවී හෝ පටිගත කළ විස්තර ප්‍රකාශයක් ද යන්න : .......................................
   (ii) සවන් දුන් දිනය : ..............................................
   (iii) ස්ථානය හා වේලාව : ..................................................
   (iv) කුමක් පිළිබඳ විස්තර ප්‍රකාශයක් ද යන්න : ...........................................
   (v) විස්තර ප්‍රකාශය කළ අය : ...........................................
   (vi) ආරාධිත පිරිස : .................................................
   (vii) සවන් දුන් ප්‍රධාන කරුණු : .............................................